ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# ඔලිම්පියාඩ් තරඟාවලිය - පාසල් මට්ටම 2025

6/7 කාණ්ඩය | විද්‍යාව | කාලය - පැය 01

**සැලකිය යුතුයි : පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයෙහිම පිළිතුරු සපයන්න**

01. ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායි සත්ත්වයෙකු වන්නේ
    1. කළු වඳුරා  2. වවුලා  3. මුවා  4. ගෝනා

02. නියං තත්ත්වයක් ලෙස දැක්වෙන්නේ වර්ෂාපතනය අපේක්ෂිත මට්ටමෙන් කොපමණ ප්‍රතිශතයකට වඩා අඩු වූ විටද?
    1. 65%  2. 75%  3. 85%  4. 95%

03. පහත දී ඇති සතුන් අතරින් ශාක භක්ෂකයින් පමණක් අයත් වන පිළිතුර තෝරන්න.
    1. මුවා, ලේනා, ගිරවා
    2. ගවයා, ගෝනා, සමනලයා
    3. මයිනා, හාවා, තාරාවා
    4. පරවියා, අලියා, ගෙම්බා

04. වායුගෝලයේ වැඩි ප්‍රතිශතයක් ඇති වායුව වන්නේ;
    1. ඔක්සිජන්
    2. නයිට්‍රජන්
    3. හයිඩ්‍රජන්
    4. කාබන්ඩයොක්සයිඩ්

05. ශාක දේහය පුරා ජලය හා ඛනිජ ලවණ පරිවහනය කරනු ලබන පටකය කුමක්ද?
    1. ප්ලෝයම පටකය
    2. මෘදුස්තර පටකය
    3. ශෛලම පටකය
    4. දෘඪස්තර පටකය

06. ආහාර නියදියක පිෂ්ටය අඩංගු බව තහවුරු කර ගැනීමට යොදා ගනු ලබන රසායනික ප්‍රතිකාරකය වන්නේ;
    1. අයඩින් ද්‍රාවණය
    2. බෙනඩික් ද්‍රාවණය
    3. සුඩාන් III ද්‍රාවණය
    4. කොපර් සල්ෆේට් ද්‍රාවණය

07. ආහාර දාමයක දෙවන පුරුක සෑම විටම ............ වේ.
    1. නිෂ්පාදකයෙක්
    2. ශාක භක්ෂකයෙක්
    3. මාංශ භක්ෂකයෙක්
    4. සර්ව භක්ෂකයෙක්



08. මෙම රූපයේ දැක්වෙන උපකරණය කුමක් ද?
    1. සුළං දිශා දර්ශකය
    2. අනිලමානය
    3. ආර්ද්‍රතාමනය
    4. වර්ෂාපතනමානය

9. මුහුදු ජලය තුළ අඩංගු වන ප්‍රධානතම ලවණය වන්නේ
    1. සෝඩියම් ක්ලෝරයිඩ්
    2. මැග්නීසියම් සල්ෆේට්
    3. මැග්නීසියම් ක්ලෝරයිඩ්
    4. කැල්සියම් කාබනේට්

10. පිනොප්තලින් බින්දුවක් සබන් ද්‍රාවණයක් තුළට දැමූ විට දැකිය හැකි වර්ණ විපර්යාසය වන්නේ
    1. රතු පැහැය
    2. රෝස පැහැය
    3. කහ පැහැය
    4. තැඹිලි පැහැය

11. සංශුද්ධ ජලයේ pH අගය වන්නේ
    1. 02  2. 05  3. 07  4. 09

12. එදිනෙදා ජීවිතයේදී භාවිතා වන අම්ලයක් වන්නේ
    1. විනාකිරි  2. සබන්  3. ලුණු  4. කොන්ඩිස්

13. කාබන් ඩයොක්සයිඩ් වායුව හඳුනා ගැනීම සඳහා අවර්ණ හුනු දියර භාවිතා කරයි. අවර්ණ හුණු දියර වල රසායනික නාමය වන්නේ
    1. සොඩියම් හයිඩ්‍රොක්සයිඩ්
    2. පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ්
    3. කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්
    4. මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ්

14. ඩයිනමෝවේ ක්‍රියාකාරීත්වය සඳහා භාවිතා වන භෞතික සිද්ධාන්තය වන්නේ

1. ඕම් නියමය
2. විද්‍යුත් චුම්බක ප්‍රේරණය
3. ෆ්ලෙමින්ගේ වමත් නීතිය
4. ස්නෙල් නියමය

15. පහත රූපයෙන් දැක්වෙන උපකරණය වන්නේ

1. රසායනික තුලාව
2. තෙදඬු තුලාව
3. නිව්ටන් තරාදිය
4. දුනු තරාදිය




16. පහත රූපය මගින් ආලෝකයේ කුමන ලක්ෂණයක් නිරූපණය වේද?

1. වර්තනය
2. පරාවර්තනය
3. විවර්තනය
4. අපකිරණය



17. සරල ධාරාවන් නිපදවන උපකරණය වන්නේ

1. වියලි කෝෂය
2. ඩයිනමෝව
3. ගෘහස්ථ විදුලිය
4. ජෙනරේටර

18. හුණුගල් අයත් වන පාෂාණ වර්ගය වන්නේ

1. ආග්නේය පාෂාණ
2. විපරිත පාෂාණ
3. අවසාදිත පාෂාණ
4. ඉහත කිසිවක් නොවේ

19. 5kg ස්කන්ධයක් සහිත වස්තුවක බර වන්නේ

1. 0.5 N
2. 05 N
3. 25 N
4. 50 N

20. උෂ්ණත්වය මැනීමට යොදාගන්නා අන්තර්ජාතික සම්මත ඒකකය වන්නේ

1. සෙල්සියස්
2. පැරන්හයිට්
3. කෙල්වින්
4. මිලිබාර්

20 x 2 = (40)

## 2 වන කොටස

**01. රූපයේ දැක්වෙන ශාක පත්‍රය නිරීක්ෂණය කර ආසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු යටින් ඉරක් අඳින්න.** (02 × 03)




i) මෙම ශාක පත්‍රයේ නාරටි වින්‍යාසය ජලාභ / සමාන්තර වේ.

ii) මෙම ශාක පත්‍රය සංයුක්ත / සරල පත්‍රයකි

iii) මෙම ශාක පත්‍රය අයත් වන ශාකය ඒක බීජපත්‍රී / ද්විබීජපත්‍රී ශාකයක් වේ.

**02. පහත දක්වා ඇති ජීවීන්ගේ සංචරණ උපාංග මොනවා ද?** (02 × 03)

i. තල්මසා - අවල්පත් / (6 ශ්‍රේණිය සඳහා පමණක් වරල් ඇති විට නිවැරදි)

ii. ඇමීබා - ව්‍යාජ පාද

iii. මී මැස්සා - පියාපත්

**03. පහත දක්වා ඇත්තේ සමනලයාගේ ජීවන චක්‍රයේ එක් එක් අවස්ථාවන් නිරූපණය කරන සටහනකි.**




i. මෙහි A හා B කොටු වලට ගැලපෙන පිළිතුරු කොටුව තුළ ලියන්න (02)

ii. පහත එක් එක් අවස්ථාවේ දී එම ජීවීන් පෙන්වන භෝජන විලාසයන් මොනවාද ? (02)

සමනලයා - යුෂ උරා බීම

දළඹුවා - විකා කෑම

iii. මෙම ජීවියා පෙන්වන රූපාන්තරණය කුමක් ද? සම්පූර්ණ රූපාන්තරණය (02)

**04. පහත දැක්වෙන්නේ වායුගෝලයේ ස්තර දැක්වෙන රූප සටහනකි.**




i. වායුගෝලයේ මුළු වායු පරිමාවෙන් 75% අඩංගු වන්නේ කවර ස්ථරයේ ද? පරිවර්ති ගෝලය (02)

ii. මෙම ස්ථර වලින් සිසිල්ම ස්ථරය කුමක් ද? මධ්‍ය ගෝලය (02)

iii. ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ කුමන ස්ථරය තුළ ද? ස්තර ගෝලය (02)

05. **රූපයේ දැක්වෙන්නේ මානව ශ්වසන පද්ධතියේ ක්‍රියාවලිය ආදර්ශනය සඳහා සකස් කරන ලද අටවුමකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




i. මෙහි A,B C යන කොටස් හා අනුරූප වන මානව ශ්වසන පද්ධතියේ කොටස දක්වන්න. (03)

A - පර්ශු කුඩුව

B - පෙනහැල්ල

C - මහා ප්‍රාචීර පේශිය

ii) ශ්වසනය යනු කුමක් ද? (02)

සංචිත ආහාර සමඟ ඔක්සිජන් වායුව ප්‍රතික්‍රියා කොට ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය

ii. ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝගයක් නම් කරන්න. (01)

ගැලපෙන නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

**06. සූර්යයාගේ සිට අහිතකර විකිරණ පොළවට පැමිණීම වලක්වාලීම සඳහා ඇති ආරක්ෂක ආවරණය ලෙස ඕසෝන් ස්ථරය දැක්විය හැකිය.**

i. ඕසෝන් ස්ථරය මඟින් පොළවට පැමිණීම වලක්වාලන අහිතකර විකිරණයක් නම් කරන්න.(02)

පරාජම්බුල කිරණ / UV කිරණ

ii. ඕසෝන් වියනට හානි කරන වායු දූෂක 2ක් ලියන්න (02)

ගැලපෙන නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

iii. ඕසෝන් වියනට හානිවීම නිසා මිනිසාට වැළඳිය හැකි රෝගයක් සඳහන් කරන්න. (02)

ගැලපෙන නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

**07. පහත දැක්වෙන උපාංග සියල්ල ම සම්බන්ධ කර ගනිමින් සැකසිය හැකි පරිපථයක පරිපථ සටහන ඇඳ දක්වන්න**

(බල්බය, ඇමීටරය, වෝල්ට් මීටරය, වියළි කෝෂය, සම්බන්ධක කම්බි, ස්විචය) (03)

ගැලපෙන නිවැරදි පරිපථ සටහන සඳහා ලකුණු ලබා දෙන්න

ii. යම් පරිපථයක පහත සඳහන් උපාංග සවිකිරීමට හේතුව සඳහන් කරන්න.(03)

a. ඇමීටරය : පරිපථයේ ගලන ධාරාව මැනීම සඳහා

b. වෝල්ට් මීටරය : පරිපථයේ විභව අන්තරය මැනීම සඳහා

c. ස්විචය : පරිපථය සංවෘත හා විවෘත කිරීම සඳහා

**08.** සරල කෝෂයක රූප සටහනක් පහත දැක්වේ




i. මෙම කෝෂයේ A හා B නම් කරන්න (02)

A. කොපර් තහඩුව

B. සින්ක් තහඩුව

ii. කෝෂය ක්‍රියා කිරීමේදී නිරීක්ෂණය කළ හැකි නිරීක්ෂණ දෙකක් සඳහන් කරන්න.
ගැලපෙන නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න (02)

iii. මෙම කෝෂයේ සම්මත ධාරාව ගලන දිශාව සඳහන් පිළිතුර යටින් ඉරක් අඳින්න

(A සිට B දෙසට ගමන් කරයි / B සිට A දෙසට ගමන් කරයි) (02)

A හා B සඳහා ගනු ලබන ලෝහය අනුව ධාරාවේ දිශාව කොපර් සිට සින්ක් දක්වා ලෙස පිළිතුරු ලබා ගන්න.

**09.** සිසුන් කණ්ඩායමක් සිදුකළ පරීක්ෂණයක රූප සටහනක් පහත දැක්වේ




i. A, B හා D නම් කරන්න. (03)

A. - තෙපාව

B. - ස්ප්‍රීතු ලාම්පුව

C. – D - උෂ්ණත්වමානය

ii. මෙහි D උපාංගය භාවිතා කරනු ලබන්නේ කුමක් සඳහාද? (01)
උෂ්ණත්වය මැනීම

iii. මෙහි B උපාංගය වෙනුවට විද්‍යාගාරයේදී භාවිතා කළ හැකි වෙනත් උපාංගයක් නම් කරන්න.(01)
බන්සන් දාහකය

iv. ජලයේ තාපාංකය සඳහන් කරන්න 100 °C (01)

**10.** පහත රූප සටහනෙන් දැක්වෙන්නේ පෘථිවියේ අභ්‍යන්තරය නිරූපණය වන රූප සටහනකි.




i. මෙහි A, B හා C කොටස් නම් කරන්න.(03)

A. - කොබෝල

B. - ප්‍රවාරණය

C. - පිටත හරය

ii. D කොටසෙහි අඩංගු ප්‍රධානතම මූලද්‍රව්‍ය කුමක්ද?
යකඩ (01)

iii. භූ විද්‍යා ගවේෂකයින් විසින් පෘථිවි අභ්‍යන්තරය පිළිබඳව තොරතුරු ලබා ගැනීමට යොදාගන්නා මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.(02)
භූමි කම්පන තරංග
ගිනි කඳු පිපිරීම්